# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1700/18 - 2011 අප්‍රේල් 07 වැනි බ්‍රහස්පතින්දා - 2011.04.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 2/2011.

**1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා පනත**

5(5) වැනි වගන්තිය යටතේ වූ නිවේදනය

1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා පනතේ 5 වැනි වගන්තියේ (5) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු වන මම 2011 අප්‍රේල් මස 12 දින සිට බලාත්මක වන පරිදි -

(අ) ශ්‍රී ලංකාවේ සම්මත වේලාව, අන්තර්ජාතික සම්මත වේලාවට (UTC) පැය 5යි මිනිත්තු 30කට කලින්වන වේලාව විය යුතු බවටත් ; සහ

(ආ) යම් සාධන පත්‍රයක හෝ වාචික ගිවිසුමක වේලාව සම්බන්ධයෙන් කරනු ලබන සඳහනක් ශ්‍රී ලංකාවේ සම්මත වේලාවට කරනු ලබන සඳහනක් බවටත්,

ප්‍රකාශයට පත් කරමි.

මෙම නිවේදනයේ -

"අන්තර්ජාතික සම්මත වේලාව" (UTC) යන්නෙන් ජාත්‍යන්තර පඩි හා මිමි කාර්යාංශය විසින් තීරණය කරනු ලැබ 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා පනතේ 6 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකාවෙහි පවත්වාගෙන යනු ලබන වේලාව අදහස් වේ.

"සාධන පත්‍රය" යන්නට යම් ලිඛිත නීතියක්, නඩු තීන්දුවක් හෝ අධිකරණයක ආඥාවක්, ඔප්පුවක්, ගිවිසුමක්, සම්මුතියක්, හෝ එවැනි වෙනත් සමාන ලේඛනයක් ඇතුළත් වේ.

ජොන්ස්ටන් ප්‍රනාන්දු,
සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2011 අප්‍රේල් මස 07 වැනි දින,
කොළඹ දී ය.

04-648

1A - G 14393— 355 (2011/04)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.